# සියදෝරිස්ට පාඩමක්




මිතුලි රත්නායක

සියදෝරිස්ට පාඩමක්

2023

මිතුලී රත්නායක
4 ශ්‍රේණිය D
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

ISBN 978-624-208-128-1

# පිදුම

මාගේ අම්මාට අප්පච්චිට අක්කාට
චූටි නංගිට අත්තම්මාට අත්තාට හා
මට අකුරු ඉගැන්වූ සියලුම ගුරු
මැණිවරුන්ටත් මම මේ පොත පුදමි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01


ගුණපාල අහිංසක ගොවියෙකි. ඔහු හේන් ගොවිතැනට දක්ෂයෙකි. වගා කර ගන්නා එළවළු ගම්මිරිස් හා කරාබු විකුණා ඔහු ජීවත් වුණා. ඔහුගේ නිවස අසලම කඩමණ්ඩියක් තිබුණා. ගෙදරට අවශ්‍ය කරන ලුණු, සීනි, සබන්, භූමිතෙල් ආදිය ලබා ගත්තේ ඔහු එළවළු විකුණන කඩයෙනි.



ඔහුට තරාදියක් තිබුණත් තරාදි පඩි තිබුණේ නැහැ. ඒ නිසා කොටුවෙන් නෙලා ගන්නා එළවළු කිරා කඩයට දීමට බැරි උනා. කඩේ මුදලාලි වන සියදෝරිස් එළවළු වලට දෙන මුදල වෙනුවට ගුණපාලට ගෙදරට අවශ්‍ය කළමනා ලබා දුන්නා. හේනේ නෙළා ගන්නා අස්වැන්න කිරා බලා කඩයට දීමට ගුණපාල ක්‍රමයක් කල්පනා කළා. මුදලාලිගෙන් කිලෝවක සීනි මුලක් කිරාගෙන ආවා.


සීනි
සබන්

එම සීනි මුල තරාදි පඩිය ලෙස තබා ගත්තා. හේනේ අස්වැන්න සරුයි. ගම්මිරිස් වැල්වල ගම්මිරිස් පැසුණා. කඩෙන් ගෙනා සීනි මුල පාවිච්චි කර ගම්මිරිස් කිලෝ එක බැගින් තරාදියට දමා කිරා ගැනීමට පටන් ගත්තා. ගම්මිරිස් කිලෝ පනහක් කිරා ගෝනියට දැම්මා. එය කඩයට ගෙන ගියා. ගුණපාල ගොඩක් විශ්වාස කළ මුදලාලි මුදල් දී ගුණපාල ගෙදර පිටත් කරා.



ඒත් මුදලාලිට ගම්මිරිස් ගෝනියේ
ප්‍රමාණය බලා සැකයක් ඇතිවුණා.
ඉක්මනින් ගම්මිරිස් ගෝනිය කිරා බැලුවා.
මුදලාලිට ලොකු තරහක් ඇතිවුණා .
කිලෝ පහක අඩුවක් ඇති බව තේරුණා.
මුදලාලි ගුණපාලට පණිවිඩයක් යවා
කඩේට ගෙන්වා ගත්තා.



සියදෝරිස් මුදලාලි ගුණපාලට නරක වචනයෙන් බැන්නා. ඉක්මනින් ආපසු හැරුණු ගුණපාල ගෙදර ගියා. ගුණපාල මුදලාලිගෙ සීනි මුල ගෙනැවිත් එය කිරා බලන්න කියා මුදලාලිට කිව්වා ග්‍රෑම් සීයක් අඩු බව තේරුම් ගත් මුදලාලි ලැජ්ජාවෙන් නිහඬ වුණා.

# ස්තූතිය

මෙම පොත රචනා කිරීමට උපකාර
කළ අම්මාටත් අප්පච්චිටත්
නිලූෂිකා ගුරු මෑණියන්ටත්
විදුහල්පතිතුමියටත් මාගේ
ස්තූතිය පුදකරමි

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01